**1.** **තනතුර - සහකාර කොමසාරිස් (ප්‍රසම්පාදන)**

**2.** **වයස** **-** අවුරුදු 22ට නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. අභ්‍යන්තර අයදුම්කරුවන්ට උපරිම වයස් සීමාව අදාල නොවේ.

**3.** **සුදුසුකම්**

**අ.** **බාහිර අයදුම්කරුවන්**

1. ව්‍යාපාර කළමනාකරණය/ ව්‍යාපාර පරිපාලනය / වාණිජ්‍යය / මූල්‍යය/ ගනකාධිකරණය/ සැපයුම් කළමනාකරණය හෝ මෙම තනතුරට අදාළ වන විෂය ක්ෂේත්‍රයකින් විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් පිළිගත් උපාධියක් ලබා තිබීම

සහ

උපාධිය ලබා ගැනීමෙන් පසු තනතුරට අදාල විෂය ක්ෂේත්‍රයකින් අවම වශයෙන් වසරක(01) ක පලපුරුද්දක් ලබා තිබීම.

**ආ.** **අභ්‍යන්තර අයදුම්කරුවන්**

1. ඉහත සඳහන් බාහිර අයදුම්කරුවන් සඳහා වන සුදුසුකම් සපුරා තිබීම.
2. "කණිෂ්ඨ කළමනාකරණ" (JM) සේවා ගණයෙහි අදාල ක්ෂේත්‍රයේ තනතුරක අවම වශයෙන් වසර පහ (05) ක සතුටුදායක සේවා කාලයක් සම්පූර්ණ කර තිබීම.

**ඇ.** **වෙනත්**

i. සැම අයදුම්කරුවෙකුම ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. තනතුරට පැවරෙන කාර්යයන් මැනවින් ඉටු කිරීම සඳහා මෙන්ම දිවයිනේ ඕනෑම ප්‍රදේශයක සේවය කිරීම සඳහා අවශ්‍ය වන කායික හා මානසික යෝග්‍යතාවයෙන් යුක්ත විය යුතුය.
iii. විශිෂ්ඨ චරිතයෙන් යුක්ත විය යුතුය.

**4.** **<u>වැටුප් තලය</u>**

ස්ථිර වැටුප් පරිමාණය - MM 1-1 2025
මූලික වැටුප - රු. 81,710.00 (2026), රු. 91,690.00 (2027)
ජීවන වියදම් දීමනාව රු: 17,800 හිමි වේ.
වෘත්තීය දීමනාව රු: 25,000 හිමි වේ (කළමනාකරණ සේවා චක්‍රලේඛ අංක 1/2025 අනුව)
වාර්ෂික වැටුප - 81,710.00 +17800.00 + 25,000.00 x 12 = රු. 1,494,120.00 (2026)
- 91,690.00 +17800.00 + 25,000.00 x 12 = රු. 1,613,880.00 (2027)

**5.** **<u>රාජකාරී ස්වභාවය</u>**

i. කාර්යාංශයේ ප්‍රසම්පාදන සැලසුම් සකස් කිරීම.
ii. වාර්ෂික ප්‍රසම්පාදන කමිටු හා තාක්ෂණ ඇගයීම් කමිටු පත්කරවා ගැනීම.
iii. වාර්ෂික අයවැය ඇස්තමේන්තුව මගින් භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීම සඳහා වෙන්කරන ලද ප්‍රතිපාදන වඩාත් කාර්යක්ෂමව යොදා ප්‍රසම්පාදන සැලැස්මට අනුව නියමිත ප්‍රසම්පාදන ක්‍රමවේදයන් අනුගමනය කරමින් භාණ්ඩ හා සේවා අත්පත් කර ගැනීමට කටයුතු කිරීම.
iv. වත්කම් කළමනාකරණ කටයුතු සිදු කිරීම.
v. මිලදී ගැනීම් වලට අදාළ බිල්පත් හා ඒ සබැඳි ලිපිලේඛන නිසි පරිදි ගෙවීම් කිරීම සඳහා අදාල අංශ වෙත යොමු කිරීම.

SINCE 2014 Gazette.lk AMBITIONS REALIZED